කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 04 WWL /20/05/18/04
වර්ණය : ඇම්බර්

# තද වැසි පිලිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2020 මැයි මස 19 වන දින ප.ව. 05.30 වන තෙක් වලංගු වන පරිදි
2020 මැයි මස 18 වන දින ප.ව. 05.30 ට නිකුත් කරන ලදී.

## ගොඩබිම් ප්‍රදේශ සඳහා

### සැලකිලිමත් වන්න!

මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව ස්ථානගතව ඇති අතිප්‍රචණ්ඩ සුළි කුණාටුව "අම්ෆන්" තවමත් දිවයිනේ කාලගුණයට බලපෑම් කරමින් පවතී.

මෙම පද්ධතියේ බලපෑම හේතුවෙන් මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශවලට, විශේෂයෙන් නුවරඑළිය, මාතලේ, රත්නපුර, කෑගල්ල, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල ඇතැම් ස්ථාන වලට මි.මී.100 පමණ තද වැසිද ඇති විය හැක.

දිවයින හරහා සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (50-60) දක්වා වැඩි විය හැක.

### අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:

- කඳුකර ප්‍රදේශ වල (විශේෂයෙන් නාය යාම් අවධානම සහිත ප්‍රදේශ වල) සහ ගංගා ආශ්‍රිතව පහත් බිම් වල ජීවත් වන ජනතාව මේ සම්බන්ධයෙන් විමසිලිමත්වන්න.
- කඳුකර ප්‍රදේශ වල මාර්ග භාවිත කරන්නන් සහ රථ වාහන පදවන්නන් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.
- අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්න.
- කඩාවැටෙන ගස්වලින් සහ විදුලි රැහැන් වලින් ආරක්ෂාවීම.
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉදිරි නිවේදන පිලිබඳ අවධානයෙන් සිටින්න.
- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.




| වර්ණය: -රතු<br>අනතුරු ඇඟවීම (පියවර ගන්න) | වර්ණය: -ඇම්බර්<br>අවවාදාත්මක (සූදානම් වන්න) | වර්ණය: - කහ<br>(අවධානයෙන් ඉන්න) | වර්ණය: -කොළ<br>(බලපෑමක් නැත) |
|---|---|---|---|

වර්ෂාපතනය(මි.මී) : තරමක් තද වැසි: 50 -100, තද වැසි: 100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි